# කලා ඔය ද්‍රෝණිය | KALA OYA BASIN

## පාරිසරික සංවේදී කලාපය




කලා ඔය ද්‍රෝණිය ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණී 103 අතරින් එකකි. දළ වශයෙන් කිලෝමීටර 25 පමණ පළලකින් යුතු කලා ඔය ද්‍රෝණියේ දිග කිලෝමීටර 150 පමණ වේ. එහි 76% ක පුලුල් පරාසයක් වියළි කලාපයට අයත් වයඹ පළාත තුළ පිහිටා තිබේ. මුහුදු මට්ටමේ සිට මීටර 600 පරාසය දක්වා විවිධ උස මට්ටම් හි පැතිර ඇති කලා ඔය ද්‍රෝණිය ශ්‍රී ලංකාව සතු මුහුදු සීමාව දක්වා විහිදී තිබීම විශේෂත්වයකි.

මෙම වපසරිය පුරා කුඩා වැව් 600ක් පමණ වේ. ඉන් කිහිපයක් නටබුන්ය. අනෙක්වා යහපත් මට්ටමේ පවතී. උතුරු මැද, මධ්‍යම හා වයඹ පළාත් ඔස්සේ ගලා බස්නා කලා ඔය, ඒ ආශ්‍රිතව ජීවත් වන ශාක හා සතුන් ඇතුලු පරිසර පද්ධතිය පෝෂණය කරයි.

කලා ඔය පරිසර සංවේදී කලාපයට දළ වශයෙන් හෙක්ටයාර 209,700ක පමණ වපසරියක් ඇතුළත් කිරීමට නව ව්‍යාපෘතිය යටතේ සැළසුම් කර තිබේ. ඒ යටතට ගොඩබිමින් හෙක්ටයාර 158,700කි. සාගරයෙන් හෙක්ටයාර 51,000ක් ඇතුළත් වේ.

### කලා ඔය ද්‍රෝණිය තුළ පිහිටා ඇති සුවිශේෂී පාරිසරික පද්ධති

බාධක පර අභය භූමිය
හෙක්ටයාර 30600

විල්පත්තු වනෝද්‍යානය
හෙක්ටයාර 131667

කහල්ල පල්ලෙකැලේ
හෙක්ටයාර 21620

රිටිගල දැඩි රක්ෂිතය
හෙක්ටයාර 1528

කරදිය වගුරු බිම්
හෙක්ටයාර 250

කඩොලාන පද්ධති
හෙක්ටයාර 620

ගංගාශ්‍රිත වනාන්තර
හෙක්ටයාර 400

වියළි කලාපීය සදාහරිත වනාන්තර
හෙක්ටයාර 200

ලඳු කැලෑ සහිත ජල තිම්න
හෙක්ටයාර 100

### කලා ඔය ද්‍රෝණිය වාසභූමිය කරගත් සත්ව විශේෂ

අලි 600 පමණද, දිවියන් 115 පමණද වල් ඌරන්, මුවන්, වැනි සිව්පා වර්ගද,

කිඹුලන්, කබරගොයින්, තලගොයින් වැනි උරග විශේෂ,

පොළඟා,පිඹුරා,ඇහැටුල්ලා,නිදි මාපිලා, හාල්දණ්ඩා,අලු රදනකයා,නයා වැනි සර්ප විශේෂ

ලූලා, කහ කොරලියා,මගුරා,සොරයා, දංකොළ පෙතියා වැනි මත්ස්‍ය විශේෂ

ඇතුලුව පැතිරී ගිය විවිධත්වයක් ඇතිව, තර්ජනයට ලක්ව මෙම කලාපය තුළ ජීවත් වේ.

ඊට අමතරව බොටුව රතු කොට්ටෝරුවා,මල් කොහා,අලු කෑදැත්තා, ගිරවා වැනි ආවේණික පක්ෂීන් මෙන්ම, විවිධ කාලවල පැමිණෙන සංක්‍රමණික පක්ෂීන් රාශියක් මෙම කලාපය තුළ නැරඹිය හැක.

### කලා ඔය ද්‍රෝණිය මුහුණ දෙන පාරිසරික ගැටලු

කලා ඔය ද්‍රෝණියේ වන වැස්ම, හේන් ගොවිතැන් සහ ජනාවාසකරණය හේතුවෙන් සීඝ්‍රයෙන් විනාශ වීම

වෙළඳම සහ අහාර සඳහා වන සතුන් දඩයම

වන විනාශය නිසා සතුන්ගේ වාසභූමි අහිමි වීම

අක්‍රමවත් ජනාවාසකරණය නිසා උද්ගත වූ අලි මිනිස් ගැටුම

### පාරිසරික සංවේදී කලාප ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ප්‍රදේශ

**සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර 17,500**

| | |
|---|---|
| තර්ජනයට ලක් වූ වනාන්තර | හෙක්ටයාර 8,000 |
| ජලාධාර හා ජලාශ පද්ධති | හෙක්ටයාර 7,000 |
| වෙරළාශ්‍රිත හා ගංගාශ්‍රිත භූමි | හෙක්ටයාර 1,000 |
| හුදෙකලා කඳුකර භූමි | හෙක්ටයාර 1,500 |

### කලා ඔය පරිසර සංවේදී කලාපය සුරැකීම

විශේෂිත සංරක්ෂණ ක්‍රමවේද අනුගමනය කරමින්, මෙම කලාපයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව සුවිශේෂී ජෛව විවිධත්වය හා පාරිසරික සේවාවන් තිරසාරව ආරක්ෂා කිරීම පිණිස විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ඇත.

ප්‍රදේශයේ ජනතාව එහි සජීවී කොටස් කරුවන් වේ. ඔවුනගේ ජීවනෝපාය ද මෙම සංරක්ෂණ වැඩපිළිවෙල තුළ සංවර්ධනය කෙරේ. පරිසර හිතකාමී ගොවිතැන ද ජෛව විවිධත්වයට හානිකර නොවන ඉඩම් භාවිත ක්‍රමවේදයන්ද එයට ඇතුළත් වේ. මුලින්ම පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රිකයන්හි පිහිටා ඇති ව්‍යාපෘති ගම්මානයන්හි එය ක්‍රියාත්මක වනු ඇත. සමස්තයක් ලෙස මේ වන විට බිඳ වැටී ඇති පාරිසරික කළමනාකරණය හා පාරිසරික පද්ධති යථා තත්වයට පත් කිරීම මෙහි අරමුණ වේ.


පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය


පරිසර සැළසුම් සහ ආර්ථික අංශය.
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
980 /4, වික්‍රමසිංහ පෙදෙස, ඇතුළු කෝට්ටෙ
විමසීම්: දීපාල් සිරිබද්දන අධ්‍යක්ෂක,(පරිසර සැළසුම් සහ ආර්ථික)
ESA ව්‍යාපෘතිය. | දුරකථන: 0112 861 726 ෆැක්ස්: 0112 887 027